# නැගෙනහිර පළාතට එක්සත් ජනපද රජයෙන් ලබා දුන් ආධාර ගැන දේශපාලන කටයුතු පිළිබඳ රාජ්‍ය උප ලේකම් ලෙස නම් කර ඇති තෝමස් ෂැනොන් දෙසැම්බර් 15 වැනිදා ත්‍රිකුණාමලයේ දී දැක්වූ අදහස්

නැගෙනහිර පළාතේ ආණ්ඩුකාරතුමා, තානාපති කාරියවසම්, විරුද්ධ පක්ෂයේ නායක තුමා හා මහ ඇමති ඇතුළු සියල්ලන්ගෙන් ම අවසරයි.

මෙය ශ්‍රී ලංකාවට මෙන් ම දකුණු ආසියාවට මම පැමිණි පළමුවැනි අවස්ථාවයි. අපි මෙහි පැමිණියේ ඊයේ හවසයි. මෙම උදෑසන කොළඹ මා සිටි හෝටලයේ සිට මනස්කාන්ත සාගරය නැරඹීමේ සතුට විඳ ගත් මම හෙලිකොප්ටරයෙන් මෙම චමත්කාරී ස්ථානයට පැමිණියෙමි. මෙහි එන අතර මට සිතුණේ දේශපාලන කටයුතු පිළිබඳ ඊළඟ රාජ්‍ය උප ලේකම් ලෙස නම් කිරීමේ ගෞරවය ලැබී ඇතත් මේ සුන්දර රටේ තානාපති වීමට මා කැමති විය හැකි බවයි.

ගෞරවනීය අමුත්තනි, නෝනාවරුනි, මහත්වරුනි. මෙම මනස්කාන්ත හෝටලයට පැමිණීමට ලැබීම සතුටට කරුණකි. ශ්‍රී ලාංකික ව්‍යවසායකයන්ගේ දැඩි කැපවීමත් අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනයේ(USAID) වෘත්තිකයන්ගේ විශේෂඥ දැනුමත් මුසු වූ විට කළ හැකි දෙයට මෙය හොඳ උදාහරණයකි.

අවුරුදු දහස් ගණනක් ඈත ට යන චිත්තාකර්ෂණීය ඓතිහාසික වාර්තාවක් ඇති ආසියාවේ පැරණි ම නගරයක් වන මෙම ස්ථානයට වඩා හෝටලයක් සඳහා සුදුසු වෙනත් තැනක් සොයා ගත නො හැක. එය ද මා දැක ඇති සුන්දර ම වෙරළක් අසලයි. මගේ එම ප්‍රකාශය වැදගත් වන්නේ කැලිෆෝනියාවේ වැසියෙක් ලෙස ලස්සන ම වෙරළ තීර මා දැක ඇති බැවිනි. තවද මෙම හෝටලය ඉදි කර ඇත්තේ ලෝකයේ විශාල ම ස්වාභාවික ගැඹුරු වරායකට ආසන්නවයි.

ශ්‍රී ලංකාවේ භූ දර්ශනවල අසිරිමත් සුන්දරත්වයෙන් හා එහි ජනතාවගේ අසමසම සත්කාරකත්වයෙන් පෝෂණය ලැබූ ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයට ඇති වාසි, එහි සාර්ථකත්වය සහතික කරන ඉස්තරම් උපාය මාර්ගයක් වෙයි. මෙහි පැමිණීමේ වාසනාව ඇති සංචාරකයන්ට පමණක් නොව හෝටලයේ වැඩ කරන සේවකයන්ට, ඔවුන්ගේ පවුල්වලට

මෙන් ම මෙයින් ජනනය වන ආර්ථික කටයුතුවලින් ප්‍රයෝජන ලබන අවට ප්‍රජාවේ බොහෝ අයට ද මෙම ව්‍යාපෘතිය වැදගත් වේ.

මම ශ්‍රී ලංකාවේ ගත කර ඇත්තේ දින දෙකකටත් අඩු කාලයක් නමුත් ශ්‍රී ලාංකිකයන්ගේ ජීවන තත්වය නඟා සිදුවීමට දිවයින පුරා ප්‍රජාවන්, සිවිල් සමාජ සංවිධාන හා පළාත් පාලන ආයතන ක්‍රියාත්මක කරන කටයුතු කෙළින්ම දැක ගැනීමට ලැබීම ඉතා ප්‍රබෝධක අත්දැකීමකි. ආර්ථික හා සමාජීය යන අංශ දෙකෙන් ම ඔබේ රට ලබා ඇති ප්‍රගතිය මා විස්මයට පත් කරවයි.

එම ප්‍රගතිය ලබා ගැනීම සඳහා එක්සත් ජනපදය ඔබට ආධාර කරන්නේ ඉතා අභිමානයෙනි. ශ්‍රී ලංකාවේ ප්‍රජාවන් හා අපේ රටවල් දෙක අතර ඇති සබඳතාව වෙනුවෙන් අවුරුදු 60කට ආසන්න කාලයක් එක්සත් ජනපද සංවර්ධන ආධාර ලබා දී තිබේ.

අපේ වැඩසටහන් රට පුරා පැතිරී ඇතිවාක් මෙන්ම ඒවා කෘෂිකාර්මික සංවර්ධනය, පරිසරය හා ස්වාභාවික සම්පත්, සෞඛ්‍යය, අධ්‍යාපනය, ප්‍රජාතන්ත්‍රවාදය හා පාලනය, ආර්ථික වර්ධනය හා මානුෂීය ආධාර ඇතුළු සෑම අංශයකට ම විහිදී තිබේ.

මෙම සහයෝගිතාව යටතේ පසුගිය දශක හය තුළ සැලකිය යුතු ජයග්‍රහණ ලබා ගැනීමට හැකිවී ඇත. මේවා අතර මැලේරියාව පාලනය කිරීම හා මුලින් උපුටා දැමීම, දුම්රිය ප්‍රවාහන ජාලය නවීකරණය, පෝෂණය දියුණු කිරීම, වාරිමාර්ග වැඩ් දියුණු කිරීම, වෙළඳ මණ්ඩල දියුණු කිරීම හා වෙනත් බොහෝ දේ වේ.

2004 සුනාමි ව්‍යසන අවස්ථාවේ ශ්‍රී ලාංකිකයන්ට සියල්ල නැවත ගොඩ නැගීම සඳහා ආධාර කිරීමට අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනය (USAID) ඉදිරිපත් විය. මේවා අතර ආරුගම්බේ පාලම, ධීවර වරාය, වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන, හා ජල සම්පාදන පද්ධතියක් ද විය. එම ව්‍යසනයෙන් නැති වූ ජීවිත හා සිදු වූ හානිය අපට කිසි දා අමතක කළ නො හැකි නමුත් අනාගතය සඳහා නැවත ගොඩ නැගීමේ දී ඔබ පෙන්වා ඇති ධෛර්ය අප විස්මයට පත් කරයි. ශ්‍රී ලංකාවේ ගැටුම් කාලය තුළත් ඉන් පසුවත් ආහාර, සෙවණ, ජලය, සනීපාරක්ෂාව, සෞඛ්‍යය හා අවශ්‍ය වෙනත් ආධාර ලබා දෙමින් අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනය (USAID) මිලියනයක් පමණ ජනතාවට උපකාර කර තිබේ.

ඉතා අසාමාන්‍ය කථා කිව හැකි අය මෙම උදෑසන මෙහි පැමිණ තිබේ. විශේෂයෙන්ම ආබාධිත තරුණ ගැහැණුන් හා පිරිමින්ගේ ජීවිත වෙනස් කිරීමට අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනය (USAID) කර ඇති කාර්යභාරය ගැන දැන ගැනීම ඇදහිය නො හැකි තරම් ය. මොවුන් දැන් තම ජීවිත නැවත ගොඩ නගා ගෙන ඇත්තේ ධෛර්යයෙන් යුතුව මෙන්ම බලාපොරොත්තු සහගතවයි.

අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනයේ (USAID) ආබාධිතයන් සඳහා වූ වැඩසටහන් මගින් ඔවුන්ගේ එදිනෙදා කටයුතු කර ගැනීමට හැකි වන සේ ප්‍රශස්ත මට්ටමේ පුනරුත්ථාපන සේවාවක් ලබා දේ. අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනයේ අනුග්‍රහයෙන් (USAID) උසස් මට්ටමේ කෘෂිකාර්මික ක්‍රම හා තාක්ෂණය පිළිබඳ ව පුහුණුව ලැබූ තරුණ ගොවියන් ද අද මෙහි පැමිණ සිටින බව මම දනිමි. මෙම කුසලතා නිසා ඔවුන්ට ඵලදායිතාව හා ඔවුන්ගේ ආදායම් වැඩි කර ගැනීමට මෙන් ම තම ප්‍රදේශයේ තරුණයන්ට ආදර්ශයක් වෙමින් ඔවුන්ගේ ප්‍රජාවන් සවි බල ගැන්වීමටත් හැකි වනු ඇත.

අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනයේ (USAID) ආධාර ඇතිව පිහිට වනු ලැබූ ඇඟලුම් කම්හල් වල වැඩ කරන තරුණ කාන්තාවන් සමග සාකච්ඡා කිරීමට මට අවස්ථාවක් ලැබෙනු ඇත. ඔවුන්ගේ රැකියා ගැන, ඔවුන්ගේ ආදායමෙන් කරන දේ ගැන මෙන් ම ඔවුන්ගේ අනාගත සැලසුම් ගැන ඔවුන්ගෙන් අසා දැන ගැනීමට මම බලාපොරොත්තු වෙමි. කාන්තාවන් සවි බල ගැන්වූ විට හා ඔවුන්ගේ සිහින වෙනුවෙන් කටයුතු කරන විට කළ හැකි දේ පිළිබඳ ව මොවුන් හොඳ උදාහරණයකි.

පසුගිය අවුරුදු 60 ක පමණ කාලය තුළ ශ්‍රී ලංකාව ලබා ඇති ජයග්‍රහණවල කොටස් කරුවෙකු වීමට ලැබීම ගැන අපි ආඩම්බර වෙමු. ඉදිරි දශකවල දී අපේ අවධානය යොමු වනු ඇත්තේ දීර්ඝ කාලීන ප්‍රගතියට තීරණාත්මක වන ක්ෂේත්‍ර කෙරෙහි ය. විශේෂයෙන්ම අඩුවෙන් සංවර්ධනය වී ඇති කලාපවල රැකියා හා වැඩි ආදායම් ජනනය කරන සාධාරණ ආර්ථික වර්ධනයක් සඳහා අපි කටයුතු කරමු. රජය, සිවිල් සමාජය හා පුරවැසියන් අතර දියුණු සහයෝගිතාවක් ගොඩනැගීමට ද අපි ක්‍රියා කරමු. එයින් අදහස් කරන්නේ ප්‍රබල නීති පද්ධතියක්, ශක්තිමත් සිවිල් සමාජයක් හා සියලු ශ්‍රී ලාංකික යන්ට අවශ්‍ය සේවාවන් සැපයිය හැකි ඵලදායි රජයකි.

වර්තමානයේ ශ්‍රී ලංකා රුපියල් බිලියන 3.2 කට (ඩොලර් මිලියන 23) වැඩි වටිනාකමක් ඇති නැගෙනහිර ප්‍රජාවට දෙන ආධාරය අපි දිගටම කර ගෙන යෑමට බලාපොරොත්තු වෙමු. ක්‍රීඩා ක්ෂේත්‍රයේ දෙමළ, සිංහල හා මුස්ලිම් තරුණයන් එක් කරන වැඩසටහන් වලට ද අපි ආධාර කරමු. ඉංග්‍රීසි භාෂා හා ව්‍යවසායකත්ව පුහුණුව මෙන් ම ලිංගිකත්වය මත පදනම් වූ හිංසනයට මුහුණ දෙන ආකාරය හා හුවමාරු වැඩසටහන් තුළින් විවිධ අවස්ථාවන් ද ලබා දෙමු.

යුද්ධයෙන් ඉතිරි වී ඇති භයානක ම දෙයක් වන බිම් බෝම්බ අනතුර තුරන් කිරීමට ද අපි නැගෙනහිර සහකරුවන් සමග කටයුතු කරමු. මෙයින් අදහස් කරන්නේ බිම් බෝම්බවල අවදානම පිළිබඳ දැනුවත් බව වැඩි කිරීම හා බිම් බෝම්බ සොයන කණ්ඩායම්වල ධාරිතාව වැඩි කිරීමයි. සැඟවුණු බිම් බෝම්බයක් නිසා අත පය කැඩී යෑම හෝ ඊටත් වඩා භයානක අනතුරකට මුහුණ දීමේ බියෙන් තොර ව ළමයෙකුට ක්‍රිකට් ක්‍රීඩා කිරීමට හෝ ගොවියෙකුට බිම් කෙටීමේ නිරත විය හැකි අනාගතයක් කරා අපි ගමන් කරමින් සිටිමු.

අවසාන වශයෙන් ගැටුමේ බලපෑමට ලක්වූ පවුල් ඔවුන්ගේ ප්‍රජාවන් අතර නැවත පදිංචි කරවීමේ කටයුතුවලට ද අපි සහභාගී වෙමු. මේ සඳහා සෙවණ සැපයීම, සනීපාරක්ෂාවේ සිට පාසල් දක්වා පුළුල් පරාසයක සේවාවන් සැපයීම අවශ්‍ය වේ.

මෙය ඉතා දිගු ගමනක් වන අතර තවත් බොහෝ දුරක් යා යුතු ව තිබේ. සාමය, සෞභාග්‍යය හා ප්‍රතිසන්ධානය කරා යන මෙම ඓතිහාසික ගමනේ දී එක්සත් ජනපදය, ශ්‍රී ලාංකික ජනතාවට ස්ථිරසාර සහායක් ලබා දෙනු ඇත. එක්ව කටයුතු කිරීමෙන් අප රටවල් දෙකේ ම ජනතාවන්ට වඩා යහපත් අනාගතයක් නිර්මාණය කිරීමට හැකි වනු නොඅනුමානයි.

ඔබ කර ගෙන යන යෝධ කාර්යයන් ගැන ඔබට සුබ පැතීමට කැමැත්තෙමි. ශ්‍රී ලංකාවේ සිදු වන දේ ගෝලීය වශයෙන් වැදගත් වේ. මේ කාලයේ මොන තරම් ප්‍රශ්න තිබුණාත් ඔබේ රට නැවත ගොඩ නැගීමටත් ඔබේ ජනතාව අතර ප්‍රතිසන්ධානය තහවුරු කිරීමටත් ගන්නා ක්‍රියා මාර්ගයේ සාර්ථකත්වය, ලෝකයේ අන් සියලු රටවලට ආදර්ශයක් වනු ඇත. මෙම ප්‍රයත්නයේදී ඔබේ සහකරුවෙක් වීමටත් ශ්‍රී ලංකාවේ මිතුරෙක් වීමටත් ලැබීම ගැන එක්සත් ජනපදය ආඩම්බර වෙයි.